# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2333/03 - 2023 මැයි මස 22 වැනි සඳුදා - 2023.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, එවකට රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 1992.12.01 දිනැති හා අංක 743/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශයට පත් කර ඇති කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "**කොම්පඤ්ඤ වීදිය**" ග්‍රාම නිලධාරි වසමේ ඉංග්‍රීසි නාමය ලෙස යොදා ඇති "Slave Island" යන්න වෙනුවට "Kompanna Veediya" ලෙසත් දෙමළ නාමය ලෙස යොදා ඇති "**ஸ்லேவ் ஐலண்ட்**" යන්න වෙනුවට "**கொம்பனித் தெரு**" ලෙසත්, එකී නාමයන් මත පදනම්ව මෙතෙක් සිදු කර ඇති කිසිදු ක්‍රියාකාරකමකට හෝ සකස් කර ඇති කිසිදු ලේඛනයකට අගතියක් නොවන පරිදි 2023.05.22 දින සිට බලපවත්නා පරිදි මෙයින් සංශෝධනය කරමි.

**දිනේෂ් ගුණවර්ධන (පා.ම.),**
අග්‍රාමාත්‍ය හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2023 මැයි මස 22 වැනි දින,
නාරාහේන්පිට,
කොළඹ 05,
නිල මැදුර පරිශ්‍රය,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ දී ය.

EOG 06 - 0120

1A - G 39714 — 07 (2023/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*